# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 36 දරන ශ්‍රී ලංකා
# ජාතික විද්‍යා සභා පනත

[සහතිකය සටහන් කළේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1975 සැප්තැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන
# ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත

[සහතිකය සටහන් කළේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 62/73

**ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද 1968 අංක 9 දරන ලංකා ජාතික විද්‍යා සභා පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍ය වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මේ පනතෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව

**2.** (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව නමින් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබේ. මේ පනතේ මේ කොටස යටතේ වූ සභාවේ ඇතට සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් ඒ සභාව සමන්විත වන්නේය.

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව පිහිටුවීම.

(2) මේ සභාව (1) වන උපවගන්තියෙන් ඊට පවරන ලද නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එම නාමය යටතේ සභාව විසින්ද සභාවට විරුද්ධ ව ද නඩු පවරනු ලැබිය හැකිය.

(3) සභාවේ ප්‍රධාන කාර්යාලය කොළඹ හෝ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ශ්‍රී ලංකාවේ වෙනත් යම් ස්ථානයක හෝ පවත්වා ගෙන යා යුතුය.

**3.** සභාවේ යුතුකම් පහත දැක්වෙන පරිදි වේ :—

සභාවේ යුතුකම්.

(1) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, එනම් :—

(අ) ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා විද්‍යාව හා තාක්ෂණ වේදය යොදා ගැනීම හා උපයෝගී කොට ගැනීම ;

(ආ) විද්‍යා ප්‍රතිපත්තියක් සකස් කිරීම ;

(ඇ) විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ සඳහා මුදල් වෙන් කිරීම ; සහ

(ඈ) අමාත්‍යවරයා විසින් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් යම් කරුණු

සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

2 -ජ 11450—10,090 (75/05)

(2) පහත දැක්වෙන අරමුණු, එනම් :—

(අ) ශ්‍රී ලංකාවේ සම්පත් වැඩි දියුණු කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ ශුභසිද්ධිය නගාලීම ; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ විද්‍යාව සහ තාක්ෂණ වේදය පොදුවේ අභිවර්ධනය කිරීම

යන අරමුණු ඇතිව විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ ආරම්භ කිරීම, එවැනි පර්යේෂණවලට අනුග්‍රහය දැක්වීම සහ ආධාර කිරීම ;

(3) විද්‍යාත්මක සහ තාක්ෂණික කරුණුවලට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ප්‍රචාරය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම ;

(4) ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල විද්‍යාඥයන් හා තාක්ෂණික යන් ද විද්‍යාත්මක හා තාක්ෂණික ආයතන ද සමග සම්බන්ධතා ඇති කර ගැනීම සහ පවත්වා ගෙන යාම ;

(5) පහත දැක්වෙන කරුණු, එනම් :—

(අ) ශ්‍රී ලංකාවෙහි සිටින විද්‍යාත්මක සහ තාක්ෂණික පිරිස් සඵල ලෙස උපයෝගී කොට ගැනීම ;

(ආ) ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රතිපත්තිය සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික මිනිස් බල පිළිබඳ අනාගත අවශ්‍යතා ; සහ

(ඇ) විද්‍යාත්මක සහ තාක්ෂණික මිනිස් බල පිළිබඳ අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් පුහුණු කිරීමේ පහසුකම් ලබාදීම සඳහා ගතයුතු පියවර

යන කරුණු අධ්‍යයනය කොට වාර්තා කිරීම ;

(6) ශ්‍රී ලංකාවෙහි ජාතික වැදගත්කමකින් යුතු වූ ද විද්‍යාත්මක, තාක්ෂණික, අධ්‍යාපනික, සමාජ විද්‍යාත්මක සහ ආර්ථික කරුණුවලට අදාළ වූ ද විෂයයන් ගැන සාවධානව ඒවා පිළිබඳ වාර්තා කිරීම ; සහ

(7) ශ්‍රී ලංකාවේ විද්‍යාව සහ තාක්ෂණ වේදය වැඩි දියුණු කිරීමට අවශ්‍ය වෙනත් කටයුතු කිරීම.

සභාවේ බලතල.

4. සභාවේ යුතුකම් ඉටු කිරීම සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍ය වන හෝ අවස්ථානුකූල වන බලතල, අයිතිවාසිකම් සහ අධිකාර සභාව සතු වන අතර, විශේෂයෙන් ම, පහත සඳහන් කටයුතු සභාව විසින් කළ හැකිය :—

(අ) යම් විශේෂ පර්යේෂණ යෝජනා ක්‍රමයක් හෝ යෝජනා ක්‍රම හෝ ආරම්භ කිරීම සඳහා නැතහොත් කරගෙන යාම සඳහා යම් විද්‍යාඥයකුට හෝ යම් තාක්ෂණිකයකුට හෝ එවැනි නැනැත්තන් කණ්ඩායමකට හෝ පර්යේෂණ ආයතනයකට හෝ යම් විශ්ව විද්‍යාලයකට හෝ යම් පිළිගත් විද්‍යා මණ්ඩලයකට හෝ මුදල් ආධාර දීම ;

(ආ) විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු සඳහා පර්යේෂණ අධිශිෂ්‍යත්ව, සහාය ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ත්‍යාග සහ පදක්කම් ඇති කිරීම සහ ප්‍රදානය කිරීම;

(ඇ) විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ කටයුතුවල නියැලුණු සංවිධාන සමග එක්ව හෝ තනිවම හෝ පර්යේෂණ හා අත්හදාබැලීම සංවර්ධන ඒකක පිහිටුවීම හා පවත්වා ගෙන යාම;

(ඈ) විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ සඳහා ආයතන හෝ පර්යේෂණාගාර ඉදිකිරීම, ඒවා උපකරණවලින් සමන්විත කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඉ) විද්‍යාත්මක සහ තාක්ෂණික ලේඛන සම්පාදන මධ්‍යස්ථාන යක් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම;

(ඊ) විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ අරමුදලක් පිහිටු වීම;

(උ) ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක සහ තාක්ෂණික පිරිස් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යාම;

(ඌ) මිලට ගැනීමෙන්, ප්‍රදානයක් මගින්, ත්‍යාග වශයෙන්, අන්තිම කැමති පත්‍රයක් මගින් දේපළ බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් සභාව වෙත පැවරුණු යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම සහ සතුව සිටීම සහ, සභාවේ රීතිවලට යටත්ව, එකී දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානයක් වශයෙන් දීම, හිමිකර දීම, අන්තිම කැමති පත්‍රයකින් හිමි කර දීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ලෙසකින් බැහැර කිරීම;

(එ) සභාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ඒ) මේ පනතින් සභාව වෙත පවරා දී ඇති බලතල, අයිතිවාසි කම් හෝ කාර්යයන් අතුරෙන් සභාවේ කටයුතු කාර්යක්ෂම ව කර ගෙන යාම සඳහා අවශ්‍ය යයි සැලකෙන යම් බලතල, අයිතිවාසිකම් හෝ කාර්ය සභාවේ විධායක කාරක සභාව වෙත හෝ සභාවේ ලේකම් ජනරාල් වෙත පැවරීම; සහ

(ඔ) සභාවේ යුතුකම් ඉටුකිරීමට අවශ්‍ය වන්නේ යයි හෝ උපයෝගී වන්නේ යයි හෝ ඊට ආනුෂංගික වන්නේ යයි සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීම.

අමාත්‍යවරයාගේ විධාන අනුව සභාව විසින් ක්‍රියා කළ යුතු බව.

**5.** සභාවේ යුතුකම් ඉටු කිරීමේ දී, කටයුතු කිරීමේ දී සහ බලතල පාවිච්චි කිරීමේ දී, අමාත්‍යවරයා විසින් කලින් කල ලිඛිතව නිකුත් කරනු ලබන සාමාන්‍ය විධාන හෝ සභාවේ උපදෙස් විමසීමෙන් පසු නිකුත් කරනු ලබන විශේෂ විධාන හෝ අනුව සභාව විසින් ක්‍රියා කළ යුතුය.

සභාවේ සංයුතිය.

6. (1) සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය :—

(අ) යම් විද්‍යා හෝ තාක්ෂණික ක්ෂේත්‍රයක ලා විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් සත්දෙනෙක් ;

(ආ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් හය දෙනෙක්, එනම් :—

(i) සභාවේ ලේකම් ජනරාල් ;

(ii) කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ විෂයය හෝ කාර්යය හෝ පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(iii) ක්‍රම සම්පාදන විෂයය හෝ කාර්යය හෝ පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(iv) මුදල් විෂයය හෝ කාර්යය හෝ පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(v) වැවිලි කර්මාන්ත විෂයය හෝ කාර්යය හෝ පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(vi) දේශීය හා විදේශීය වෙළෙඳාම පිළිබඳ විෂයය හෝ කාර්යය හෝ පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක්.

(2) යම් තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම් හෝ මන්ත්‍රී ධුරයකට පත් වේ නම්, ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකත්වය දැරීමට හෝ නුසුදුස්සෙක් වන්නේය.

සභාවේ සභාපති සහ උප සභාපති.

7. (1) සභාවේ පත් කළ සාමාජිකයන් අතුරෙන් කෙනකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපති ධුරයට පත් කරනු ලැබිය යුතුය.

(2) සභාවේ පත් කළ සාමාජිකයන් අතුරෙන් කෙනකු සභාවේ උප සභාපති ධුරයට සභාවේ සාමාජිකයන් විසින් තෝරා පත් කර ගත යුතුය. සභාපති නොමැති විට හෝ සභාපති ධුරය පුරප්පාඩු වී තිබෙන විට හෝ උප සභාපති විසින් සභාපතිගේ යුතුකම් ඉටු කළ යුතුය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**8.** (1) මරණය, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන කලින් තම ධුරය හිස් කරනු ලැබුව හොත් මිස සභාවේ පත් කළ සෑම සාමාජිකයෙක් ම තුන් අවුරුදු කාලයක් තම ධුරය දරන්නේය.

(2) නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයෙක් ම ඔහු සාමාජිකයකු වශයෙන් පත් කරන ලද්දේ යම් තනතුරක් දැරීම හේතු කොට ගෙනද ඒ තනතුර දරන තාක් කල් සාමාජිකත්වය දරන්නේය.

සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**9.** (1) සභාවේ යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම ප්‍රඥාගෝචර යයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කිසිදු හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකිය.

(2) සභාවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ කල්හි එම නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ දී ඒ සාමාජිකයා විසින් තම ධුරය අත් හැරිය යුතුය.

(3) සභාවේ යම් සාමාජිකයකු (1) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම, කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම.

**10.** සභාවේ පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් කවර වේලාවක දී වුව ද තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය. එසේ ඉල්ලා අස්වීම තමා පිළිගත් බවට අමාත්‍යවරයා විසින් එම සාමාජිකයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලබන තෙක් ඒ ඉල්ලා අස්වීම බල නොපාන්නේය.

සාමාජිකයන් අතර ඇති වන අනියම් පුරප්පාඩු.

**11.** (1) සභාවේ පත් කළ සාමාජිකයකු මිය ගිය විට හෝ ධුරයෙන් ඉල්ලා අස් වූ විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට, එසේ මිය ගිය හෝ ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට සාමාජිකත්වය දැරීමට වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි යථා පරිදි සැලකිලිමත් වෙමින් පත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ඉල්ලා අස්වීම නිසා හෝ මරණය නිසා හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා හෝ කලින් තම ධුරය හිස් කළ හොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතුරු වී ඇති ධුර කාලය තුළ ඔහු විසින් ධුරය දැරිය යුතුය.

සභාවේ සාමාජිකයන් තාවකාලිකව පත් කිරීම.

**12.** රෝගාතුරවීම නිසා හෝ දුබලතාවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාවේ සාමාජිකයකු තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක ඒ බව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දීම එවැනි සාමාජිකයකුගේ යුතුකම වන්නේය. එවිට අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි යථා පරිදි සැලකිලිමත් වෙමින්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකිය.

නැවත පත් කරනු ලැබීමට සාමාජිකයක් සුදුසු බව.

**13.** 9 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නොවන, ධුරය අත් හැර යන සභාවේ යම් සාමාජික යෙක්, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වේ.

පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත් වීමෙහි යම් දෝෂයක් හේතු කොටගෙන සභාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස නොසැලකිය යුතු බව.

**14.** සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස නොසැලකිය යුතුය.

සභාවේ මුද්‍රාව තැබීම.

**15.** (1) සභාවේ මුද්‍රාව සභාව භාරයෙහි තිබිය යුතුය.

(2) සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට සභාවේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) සභාවේ මුද්‍රාව තැබීම, සභාවේ සභාපතිගේ හෝ මුද්‍රාව තැබීම සහතික කිරීමට සභාව විසින් බලය දෙන ලද සභාවේ වෙනත් යම් සාමාජිකයකුගේ හෝ අත්සන සහ සභාවේ ලේකම් ජනරාල්ගේ හෝ තත් කාර්යය සඳහා ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සභාව විසින් නම් කර බලය පවරන ලද සභාවේ වෙනත් යම් නිලධරයකුගේ හෝ අත්සන තැබීමෙන් සහතික කරනු ලැබිය යුතුය.

සභාවේ සාමාජිකයන්ගේ වියදම් ප්‍රතිපූරණය කිරීම.

**16.** සභාවේ සාමාජිකයන්ට කිසිදු පාරිශ්‍රමිකයක් නො ගෙවනු ලැබිය යුතු නමුත් සභාවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා හෝ සභාව විසින් අනුමත කරන ලද සභාවේ කටයුතුවලට සම්බන්ධ වෙනත් කාර්ය සඳහා හෝ සභාවේ සාමාජිකයන් විසින් දරන ලද ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ අනියම් වියදම් සභාවේ අරමුදලින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතුය.

සභාවේ රැස්වීම්.

**17.** (1) යටත් පිරිසෙයින් සෑම තුන් මසකට වරක් වත් සභාවේ රැස්වීම් පවත්වනු ලැබිය යුතුය.

(2) සභාවේ රැස්වීමක ගණපූරණය හයදෙනකු විය යුතුය.

(3) සභාවේ රැස්වීමක මූලාසනය සභාපති විසින් හෝ ඔහු පැමිණ නොසිටි නම් උපසභාපති විසින් හෝ ඔවුන් දෙදෙනාම පැමිණ නොසිටි නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් හෝ දැරිය යුතුය.

(4) සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීමට ඇති සියලු ප්‍රශ්න එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය. සමසමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී මූලාසනය දරන නිලධරයාට තීරක ඡන්දයක් තිබේ.

(5) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම් පැවැත්වීම පිළිබඳවත් ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ කළ යුතු කටයුතු පිළිබඳවත් වූ රීති මේ පනත යටතේ සාදනු ලැබිය හැකිය.

විධායක කමිටුව.

18. (1) සභාවේ විධායක කමිටුව—

(අ) සභාවේ සභාපති;

(ආ) සභාවේ උපසභාපති;

(ඇ) සභාවේ ලේකම් ජනරාල්; සහ

(ඈ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) (ii) වන ඡේදය යටතේ නිල බලයෙන් පත්වූ සාමාජිකයා

යන අයගෙන් සමන්විත වන්නේය.

(2) මේ පනතින් සභාව වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, යුතුකම් හෝ කාර්ය අතුරෙන් සභාවේ කටයුතු කාර්යක්ෂම අන්දමින් කරගෙන යාම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන බලතල, යුතුකම් හෝ කාර්ය කිසිවක් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද විධායක කමිටුව වෙත පැවරිය හැකිය.

(3) විධායක කමිටුවේ රැස්වීම් පිළිබඳවත් ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ කළ යුතු කටයුතු පිළිබඳවත් වූ රීති මේ පනත යටතේ සාදනු ලැබිය හැකිය.

සභාවේ කාර්‍යාධිකාරී කමිටු.

19. (1) (අ) සභාවේ යුතුකම් ඉටු කිරීමෙහි ලා සභාවට සහාය වීමට අවශ්‍ය වන්නේ යයි සලකනු ලබන කාර්‍යාධිකාරී කමිටු පත් කිරීමත් ඒ කමිටුවල සාමාජිකයන් වීමට සුදුසු යයි සලකනු ලබන (සභාවට සම්බන්ධතාවක් ඇති හෝ නැති) තැනැත්තන් ඒවාට පත් කිරීමත් සභාවේ නිර්දේශය අනුව අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

(ආ) (අ) ඡේදය යටතේ පත් කරන ලද කාර්‍යාධිකාරී කමිටුවක සාමාජිකයන් අතුරෙන් එක්කෙනකු ඒ කමිටුවේ සභාපති ධුරයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. එසේ පත් කරනු ලැබූ සභාපති ඒ කාර්‍යාධිකාරී කමිටුවේ රැස්වීම් කැඳවන්නා වන්නේය.

(2) කාර්‍යාධිකාරී කමිටුවක රැස්වීම් යටත් පිරිසෙයින් සෑම දෙමසකට වරක් වත් පවත්වනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාර්‍යාධිකාරී කමිටුවක සාමාජික සංඛ්‍යාව හතකට වැඩි නොවිය යුතුය.

(4) (1) වන උපවගන්තිය යටතේ කාර්‍යාධිකාරී කමිටුවකට පත් කරන ලද සෑම සාමාජිකයකු ම දෙවර්ෂයක් ඒ ධුරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වේ.

(5) සභාවේ බලතල අතුරින් සුදුසු යයි සභාව විසින් සලකනු ලබන බලතල කිසිවක් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද කාර්‍යාධිකාරී කමිටුවකට පැවරිය හැකිය. එහෙත් සභාව විසින් එවැනි කමිටුවකට පවරන ලද බලතල කිසිවක් සභාවට අහිමි නොවේ. කාර්‍යාධිකාරී කමිටුවක් විසින් ගනු ලැබූ තීරණයක් සභාව විසින් සංශෝධනය කරනු ලැබිය හැකිය; නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

(6) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ කාර්‍ය්‍යාධිකාරී කමිටුවක සාමාජිකයන්ට කිසිදු පාරිශ්‍රමිකයක් නොගෙවනු ලැබිය යුතු නමුත් එවැනි කමිටුවක රැස්වීම්වලට සහභාගිවීම සඳහා හෝ සභාව විසින් අනුමත කරන ලද සභාවේ කටයුතුවලට සම්බන්ධ වෙනත් කාර්ය සඳහා හෝ ඒ සාමාජිකයන් විසින් දරන ලද ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ අනියම් වියදම් සභාවේ අරමුදලින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතුය.

(7) කාර්‍ය්‍යාධිකාරී කමිටුවක රැස්වීම් පිළිබඳවත් ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ කළ යුතු කටයුතු පිළිබඳවත් වූ රීති මේ වගන්තියේ පෙරාතුව සඳහන් විධිවිධාන වලට යටත්ව මේ පනත යටතේ සාදනු ලැබිය හැකිය.

## II වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

සභාවේ ලේකම් ජනරාල් සහ අනෙක් නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

20. (1) සභාව විසින්, අමාත්‍යවරයා විමසා, සභාවේ ලේකම් ජනරාල් වශයෙන් තැනැත්තකු පත් කළ යුතුය. ඔහු සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර සභාවේ පූර්ණ කාලීන නිලධරයෙක් වන්නේය. අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන නියම සහ කොන්දේසි මත ලේකම් ජනරාල් සේවයෙහි යොදවනු ලැබිය යුතුය.

(2) ලේකම් ජනරාල් ධුරය පුරප්පාඩු වුව හොත් හෝ නිවාඩු ගැනීම, රෝගාතුරවීම හෝ වෙන යම් හේතුවක් නිසා තම ධුරයේ යුතුකම් ඉටු කිරීමට ලේකම් ජනරාල් තාවකාලිකව අපොහොසත් වුව හොත්, එම ධුරයේ කටයුතු කරගෙන යාම සඳහා සුදුසු යයි සභාව විසින් සලකනු ලබන වැඩ පිළිවෙළක්, සභාව විසින්, අමාත්‍ය වරයාගේ අනුමතියට යටත්ව, හැකි තාක් ඉක්මණින් යෙදිය යුතුය.

(3) සභාවේ යම් බල මණ්ඩලයක, පුද්ගල මණ්ඩලයක හෝ කමිටුවක යම් රැස්වීමක් කැඳවීමේ, ඊට සහභාගිවීමෙ සහ එහි දී කථා කිරීමේ හිමිකම ලේකම් ජනරාල්ට තිබෙන නමුත් ඔහු ඒ බල මණ්ඩලයේ, පුද්ගල මණ්ඩලයේ හෝ කමිටුවේ සාමාජිකයකු වුව හොත් මිස එවැනි රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීමේ හිමිකම ඔහුට නැත.

(4) මේ පනතේ විධිවිධානවලට යටත් ව සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ඒවා ක්‍රියාත්මක කරනු ලබන බවට වගබලා ගැනීම හෝ ලේකම් ජනරාල්ගේ යුතුකම වන්නේය.

(5) මේ පනත මගින් සභාව වෙත පවරා ඇති හෝ නියම කර ඇති බලතල, යුතුකම් හෝ කාර්ය අතුරින් සභාවේ කටයුතු කාර්යක්ෂම ව කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන බලතල, යුතුකම් හෝ කාර්ය කිසිවක් සභාව විසින් ලේකම් ජනරාල් වෙත පැවරිය හැකි අතර, සභාව විසින් එසේ තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්ය කිරීම හෝ යුතුකම් ඉටු කිරීම ලේකම් ජනරාල්ගේ යුතුකම වන්නේය.

(6) අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන වෙනත් නිලධරයන් සහ සේවකයන් සභාව විසින් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකිය.

21. (1) මේ පනතේ සෙසු විධිවිධානවලට යටත් ව, සභාව විසින්— සභාවේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සභාව සතු බලතල.

(අ) සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ එහි විනය පාලනය පවත්වාගෙන යාම කළ හැකිය ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ පඩි හෝ වැටුප් හෝ අනෙකුත් පාරිශ්‍රමික නිශ්චය කළ හැකිය ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි සහ සේවා තත්ත්වයන් නිශ්චය කළ හැකිය ; තව ද

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත පිණිස අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම හෝ පිහිටුවීම හා විධිමත් කිරීමත් එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීමත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සෑදිය හැකිය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ සිටින අමාත්‍ය වරයා භාරයේ ඇති අමාත්‍යාංශයේ ලේකම්ගේ ද කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා, සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය ; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය. රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන හැර ඒ උපවගන්තියේ අනිකුත් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(5) නිශ්චිත කාල පරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු සභාව විසින් සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන යම් කාල පරිච්ඡේදයක් වේ නම් එය, යට කී ගිවිසුමේ බැඳීම ඉටු කිරීම් වස් ඔහු විසින් ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතුය.

(6) සභාවේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ හෝ නිලධරයාගේ හෝ සේවකයාගේ හෝ කැමැත්ත ද අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ද ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයකට, සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබිය හැකිය; එසේ නැතහොත් විශ්‍රාම වැටුප් හිමිකම් හෝ අර්ථසාධක අරමුදල් හිමිකම් හෝ පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළු ව සභාව සහ එකී ලේකම් හෝ අදාළ පළාත් පාලන ආයතනය හෝ අතර ගිවිස ගනු ලබන නියමයන් සහ කොන්දේසි යටතේ, එම සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා හෝ සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකිය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් තැනැත්තකු තාවකාලිකව සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(8) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, අර්ථසාධක අරමුදල් හිමිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ඇතුළු ව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සභාව එකඟ වන නියමයන් හා කොන්දේසි යටතේ සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව හෝ ස්ථිර ව පත් කරනු ලැබිය හැකිය.

(9) (8) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

## III වන කොටස

## මුදල්

සභාවේ අරමුදල.

**22.** (1) සභාවට සභාවේ ම අරමුදලක් තිබිය යුතුය.

(2) (අ) සභාවේ පරිහරණය සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්; සහ

(ආ) සභාවේ බලතල, කාර්ය සහ යුතුකම් ක්‍රියාත්මක කිරීමෙහි, කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා සභාව ලබා ගන්නා ලද සියලු මුදල්

සභාවේ අරමුදලට ගෙවිය යුතුය.

(3) මේ පනත හෝ වෙන යම් ලිඛිත නීතියක් හෝ යටතේ සභාවේ බලතල, කාර්ය සහ යුතුකම් ක්‍රියාත්මක කිරීමෙහි, කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා සභාව විසින් දරනු ලබන වියදම් ගෙවීමට අවශ්‍ය

වන සියලුම මුදල් සහ සභාවේ අරමුදලින් ගෙවීමට මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ නියමිත සියලුම මුදල් සභාවේ අරමුදලින් ගෙවිය යුතුය.

23. (1) සභාවේ ආදායම ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය. — බදුවලින් සහ තීරුබදුවලින් නිදහස් කිරීම.

(2) අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයා විමසා අනුමත කරන්නේ නම්, සභාව විසින් ආනයනය කරනු ලබන හෝ බන්ධිත ගුදමෙන් මිලට ගනු ලබන හෝ යම් භාණ්ඩ වෙනුවෙන් යම් තීරු බද්දක් හෝ දේශීය භාණ්ඩ බද්දක් ගෙවීමෙන් සභාව නිදහස් වන්නේ ය.

24. සභාවේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන දොළොස් මසක කාල පරිච්ඡේදය වන්නේය. — මුදල් වර්ෂය.

25. සභාවේ මුදල් පාලනයට සහ ගිණුම්වලට 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය. — 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ වීම.

## IV වන කොටස

## පොදු විධිවිධාන

26. (1) රීති සෑදීමට මේ පනතින් බලය ලැබී ඇති හෝ නියමිත හෝ කරුණු සියල්ලම නැතහොත් ඉන් යමක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සෑදිය හැකිය. — රීති සෑදීමට සභාවට ඇති බලය.

(2) මේ පනත යටතේ සභාව විසින් සාදනු ලබන කිසිම රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු බල නොපැවැත්වේ.

27. සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබේ. — සභාවේ සේවකයන් රාජ්‍ය සේවකයන් බව.

28. සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය. — අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

29. (1) (අ) සභාව විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවට විරුද්ධ ව; හෝ — මේ පනත යටතේ හෝ සභාවේ මෙහෙයවීම පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ මෙහෙයවීම පිට හෝ සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධ ව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ සභාව විසින් හෝ සභාවට විරුද්ධ ව හෝ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරන ලද යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අය කරගන්නා ලද යම් ගාස්තු සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ සභාවේ මෙහෙයවීම පිට හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධ ව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගනිතහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගන්නා ලද්දේ නම් මිස, සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

සභාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**30.** සභාවට විරුද්ධ ව පවරන ලද කවර හෝ නඩුවක දී සභාවේ සාමාජිකයකුට විරුද්ධ ව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධ ව හෝ රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතුය.

ගිවිසුම්.

**31.** සභාවේ බලතල, කාර්ය හා යුතුකම් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට හෝ එකඟ වීම්වලට එළඹීම හා ඒවා ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම සභාව විසින් ම හෝ සභාව විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් කළ හැකිය.

ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ සභාව සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

**32.** (1) සභාවේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත් කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද යෝජිත අත් කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ දේපළ ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අත් කර ගනු ලැබ සභාව වෙත පවරනු ලැබිය හැකිය.

(2) ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් සභාව වෙනුවෙන් අත් කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් සභාව විසින් ගෙවිය යුතුය.

රජයේ වංචල සහ නිශ්චල දේපළ සභාවේ භාවිතය සඳහා දිය යුතු බව.

**33.** (1) රජයේ යම් නිශ්චල දේපළක් සභාවේ කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සභාව වෙත ඒ දේපළ පිළිබඳව කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන බද්දකට ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, අදාළ වන්නේය.

(2) රජයේ යම් චංචල දේපළක් සභාවේ කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ දේපළෙහි සන්තකය සහ පාවිච්චිය සභාව වෙත පවරා සතු කර දිය හැකිය.

34. මේ පනත යටතේ සභාවට අවශ්‍ය විය හැකි වූ ද යම් තැනැත්තකුගේ දැනුම විෂය කොට ගත්තා වූ ද සියලුම වාරවාර්තා සහ තොරතුරු ලිඛිත දැන්වීමක් මගින් නිශ්චය කොට දක්වනු ලබන කාලසීමාවක් ඇතුළත සභාව වෙත හෝ ඒ සඳහා සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු වෙත හෝ සපයන ලෙස, සභාව විසින් හෝ ඒ තැනැත්තා විසින් හෝ ඒ ලිඛිත දැන්වීම මගින් එකී මුලින් කී තැනැත්තාට නියම කළ හැකිය. වාර වාර්තා සහ තොරතුරු.

35. යම් ඉඩමක හෝ යම් ස්ථානයක හෝ අයිතිකරුට නැතහොත් එය පරිහරණය කරන්නාට යටත් පිරිසෙයින් තුන් දිනක්වත් කල් දී ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු ඒ ඉඩමට හෝ ස්ථානයට ඇතුළු වීම ද සභාවේ යම් වැඩක් කිරීමේ කාර්යය සඳහා නැතහොත් සභාවේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ සභාවේ යම් කාර්යයක් ඉටු කිරීමට හෝ මූලික වන නැතහොත් ආනුෂංගික වන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් කිරීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය වන ක්‍රියාවක් එහි දී කිරීම ද ඒ සඳහා විශේෂයෙන් හෝ පොදුවේ බලය ලත් සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් කළ හැකිය. යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ බලය.

36. (1) (අ) මේ පනත යටතේ හෝ එහි කාර්යයන් සඳහා හෝ සකස් කරනු ලබන හෝ දෙනු ලබන යම් වාර වාර්තාවක නැතහොත් වෙනත් ලේඛනයක දැන දැනම අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන ; හෝ වැරදි සහ දඬුවම්.

(ආ) තමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට මේ පනත යටතේ නියමිත යම් තොරතුරක් හෝ වාර වාර්තාවක් හෝ ඉදිරිපත් කිරීම පැහැර හරින නැතහොත් ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඇ) මේ පනත මගින් හෝ එය යටතේ හෝ යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ නැතහොත් පනවනු ලැබූ බලයක්, කාර්යයක් හෝ යුතුකමක් ක්‍රියාත්මක කිරීමෙහි ලා, කිරීමෙහි ලා හෝ ඉටු කිරීමෙහි ලා එම තැනැත්තාට විරෝධය දක්වන හෝ බාධා කරන ; හෝ

(ආ) සභාවේ සාමාජිකයකු ව හෝ නිලධරයකු ව හෝ සේවකයකු ව හෝ සිටිමින්, මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ යුතුකම් ඉටු කිරීමේ දී හෝ ඊට සම්බන්ධ ව තමා විසින් ලබාගත් යම් තොරතුරක්, මේ පනත යටතේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ යම් යුතුකමක් ඉටු කිරීමේ කාර්යය සඳහා ඒ තොරතුරු අවශ්‍ය වන තැනැත්තකුට හැර වෙනත් තැනැත්තකුට හෙළි කරන; හෝ

(ඉ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් හෝ උල්ලංඝනය කරන නැතහොත් ඒ විධිවිධානයට හෝ රීතියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින

සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපැවැත්වෙන බව.

37. වෙන යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්වෙන අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ එකී වෙනත් නීතියේ විධිවිධාන හා අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් හෝ ඇති වුව හොත් මේ පනතේ විධිවිධාන එකී වෙනත් නීතියේ විධිවිධාන අභිබවා බලපැවැත්වේ.

## V වන කොටස

### ඉවත් කිරීම් සහ සංක්‍රමණ විධිවිධාන

1968 අංක 9 දරන පනත ඉවත් කිරීම.

38. 1968 අංක 9 දරන ලංකා ජාතික විද්‍යා සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

සංක්‍රමණ විධිවිධාන.

39. නියමිත දිනයෙහි දී,—

(අ) කලින් තිබූ සභාවේ සේවයේ යෙදී සිටි සියලුම නිලධරයන් සහ සේවකයන් සභාවේ සේවයේ යෙදී සිටින නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, හැකි තාක් දුරට, කලින් තිබූ සභාවේ සේවයේ යෙදී සිටිය දී ඔවුන් දැරූ තත්ත්වයම ඇතිව සහ වැටුප හෝ පඩිනඩි, සේවය අවසන් කිරීම, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධ නියමයන් ඇතුළු ව, එම සභාවේ සේවයේ යෙදී සිටිය දී ඔවුන් යටත් වුනු නියමයන්ට අනුව, ඔවුන් තම ධුර දැරිය යුතුය ;

(ආ) කලින් තිබූ සභාව විසින් හෝ එම සභාව සමග හෝ එම සභාව සඳහා හෝ ඇති කර ගත් ණය, බැඳීම් සහ වගකීම්, ලියා අත්සන් කළ හෝ බැඳුනු සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් හෝ වෙනත් සාධන පත්‍ර සහ ඉටු කිරීමට ගිවිසගත් සියලු කරුණු හා දේ, මේ වගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාව සමග හෝ සභාව සඳහා හෝ ඇති කර ගත් ලෙස, ලියා අත්සන් කළ ලෙස, බැඳුනු ලෙස සහ ඉටු කිරීමට ගිවිසගත් ලෙස සලකනු ලැබිය යුතුය ;

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වලට යටත්ව, කලින් තිබූ සභාව විසින් හෝ ඒ සභාවට විරුද්ධව හෝ පවරනු ලැබූ හෝ පැවරිය හැකිව තිබූ හෝ සියලු සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් සිවිල් හා අපරාධ නඩු කටයුතු සභාව විසින් හෝ සභාවට විරුද්ධ ව හෝ, දිගටම පවත්වාගෙන යාම හෝ පැවරීම කළ යුතුය ;

(ඈ) කලින් තිබූ සභාවේ වාසියට හෝ ඒ සභාවට විරුද්ධ ව හෝ නිසි අධිකරණයක් විසින් කරන ලද සියලුම තීන්දු ප්‍රකාශ හෝ ආඥා, සභාවේ වාසියට හෝ සභාවට විරුද්ධ ව හෝ කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතුය ;

(ඉ) කලින් තිබූ සභාව වෙත සතු කරන ලද හෝ, ඒ සභාව විසින් නීත්‍යානුකූල ව මිලට ගන්නා ලද නැතහොත් අත් කරගන්නා ලද හෝ, ඒ සභාවට බදු දෙන ලද හෝ, ඒ සභාවේ පරිහරණය සඳහා දෙනු ලැබූ හෝ, වෙනත් යම් ආකාරයකින් ඒ සභාව වෙත පවරන ලද හෝ, ඒ සභාව සන්තකයේ හෝ ඒ සභාවේ පාලනය යටතේ ඇති සියලුම චංචල හෝ නිශ්චල දේපළ, ඒ දේපළවලට අනුයුක්ත හෝ අදාළ භාර, අය කිරීම්, වගකීම්, සීමා කිරීම්, පරවශතා හෝ වෙනත් බැඳීම්වලට යටත් ව සහ ඒ දේපළ විලට අනුයුක්ත හෝ අදාළ නියමයන් සහ කොන්දේසි මත, සභාව විසින් හෝ සභාව සඳහා හෝ භාරයක් වශයෙන් තබාගත යුතුය ;

(ඊ) කලින් තිබූ සභාව විසින් සාදන ලද සියලු රීති සභාව විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතුය ;

(උ) 1968 අංක 9 දරන ලංකා ජාතික විද්‍යා සභා පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද, කලින් තිබූ සභාවේ අරමුදල සභාවේ අරමුදල ලෙස සලකනු ලැබිය යුතුය.

අර්ථ නිරූපණය.

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කලින් තිබූ සභාව" යන්නෙන් 1968 අංක 9 දරන ලංකා ජාතික විද්‍යා සභා පනත යටතේ පිහිටුවනු ලද සභාව අදහස් වේ;

"ලේකම් ජනරාල්" යන්නෙන් සභාවේ ලේකම් ජනරාල් අදහස් වේ.